# සද්ධර්ම පුණ්ඩරික සූත්‍රයේ අන්තර්ගතය පිළිබඳ විමර්ශනයක්

**පනාමුරේ චන්දිම හිමි**

## ප්‍රවේශය

හීනයාන සහ මහායාන යන සම්ප්‍රදාය දෙකෙහි අන්තර්මධ්‍ය අවස්ථාව බෞද්ධ සංස්කෘත සාහිත්‍යයෙන් ප්‍රකට වෙයි. එහෙත් මහායාන සම්ප්‍රදායට අයත් ත්‍රිපිටකයක් පිළිබඳ සඳහන් නොවේ. මහායානය යනු ද සන්ධානගත එකම නිකායක් නියෝජනය කරන සම්ප්‍රදායක් නොවන බැවිණි. කණිෂ්ක අධිරාජ්‍යයා යටතේ පැවැත්වුණු සර්වාස්තිවාදී ධර්ම සංගීතය පිළිබඳ සත්‍ය වූ තොරතුරු වාර්තා වුව ද මහායාන සම්ප්‍රදායට සුවිශේෂි වූ ත්‍රිපිටකයක් හෝ පිටක ග්‍රන්ථ සම්පාදනය වූ බවක් නොපැවසෙයි. සිව්වන ධර්ම සංගායනාව වන විටත් නව ධර්ම හෝ මහායාන ධර්ම ග්‍රන්ථ බිහි වී තිබූ බවට පිළිගත හැකි සාධක නැත.

හියුං සියැන් හිමියන් විසින් අනුවාදනය කෙරුණු බෝධි සත්ත්ව පිටක සූත්‍ර නම් කෘතියේ නව ධර්ම සූත්‍ර මෙන්ම තවත් මහායාන සූත්‍ර ග්‍රන්ථ පිළිබඳ දීර්ඝ නාමාවලියක් සඳහන් වේ. මේ අනුව සිව්වන ධර්ම සංගායනාවෙන් අනතුරුව නව ධර්ම සාහිත්‍යය බිහි වන්නට ඇතැයි සිතිය හැකිය. එසේම චීන දේශාටක භික්ෂුව වූ හයුං සියැන් හිමියන්ගේ සංචාරයට පෙර මෙම ග්‍රන්ථ රචනා වන්නට ඇතැයි සිතිය හැකිය. මේ පිළිබඳ අධ්‍යයනයක යෙදුණු මහාචාර්ය වින්ටර් නීට්ස් පඬිවරයා ද තම ඉන්දීය සාහිත්‍යයේ ඉතිහාසය නම් කෘතියේදී ප්‍රකාශ කරනු



ලබන්නේද ක්‍රි.ව. 1ත් 2ත් අතර කාලය තුළ මෙම නව ධර්ම ග්‍රන්ථ බිහිවන්නට ඇති බවයි.[1]

ථේරවාද සම්ප්‍රදායේ විනය පිටකය සහ අභිධර්ම පිටකය ගැන එහි සඳහන් වෙයි. එහෙත් එය ද මහායාන සූත්‍ර වර්ගීකරණය කිරීමට දැරූ ප්‍රයත්නයක් සේ පිළිගත හැකිය. මහායාන සම්ප්‍රදායේ ද විවිධ අනුකොටස් දැකිය හැකි අතර නව ධර්ම යනු එක් සම්ප්‍රදායකට අයත් ග්‍රන්ථ සමූහයක් නොවන අතර මහායානයේ ම විවිධ සම්ප්‍රදායන් විසින් ගොඩ නගනු ලැබූ ධර්ම සාහිත්‍යයක් බව පිළිගත හැකිය. මහාසාංඝික සම්ප්‍රදාය මහායානය දක්වා විකාශයට පත්වීමේ දී ඒ ඒ නිකායන්ගේ දෘෂ්ටි මතිමතාන්තර ආකල්පමය වශයෙන් පමණක් ගැනීමෙන් සෑහීමකට පත් නොවී ඔවුන්ගේ අනන්‍යතාව ආරක්ෂා කරගනු වස් තම අදහස් ග්‍රන්ථ ගත කිරීමට ද ඔවුහු ක්‍රියා කළහ. ථේරවාද පිටක ග්‍රන්ථයන්ට අමතරව සංස්කෘත, මිශ්‍ර සංස්කෘත ප්‍රාකෘත වැනි භාෂාවලින් සුවිශාල ග්‍රන්ථ සාහිත්‍යයක් බිහි වීම එහි මූලික ප්‍රතිඵලය විය. මහායාන බුදු සමයේ මූලික සංකල්ප හඳුනා ගැනීමට මිශ්‍ර සංස්කෘත භාෂාවෙන් රචිත නව ධර්ම නමින් හඳුන්වන එකී සාහිත්‍යය මහෝපකාරී වන බව මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා ද ප්‍රකාශ කරයි.[2] එසේම මහායානයේ පදනම හඳුනා ගැනීමට ද මෙම ග්‍රන්ථයන් උපකාරී වෙයි.

වර්තමානයේ ලොව පුරා මහායාන බෞද්ධයන් විසින් ඉමහත් ගෞරවයෙන් පිළිගනු ලබන නව ධර්ම නමින් ප්‍රකට වූ ග්‍රන්ථ නවයක් වෙයි. විශේෂයෙන් නේපාලීය මහායාන බෞද්ධයන් මෙම ග්‍රන්ථ ඉමහත් ගෞරවයෙන් සම්භාවනාවට ලක් කරනු ලබයි.[3] අනෙකුත් මහායාන සම්ප්‍රදාය ව්‍යාප්ත වී ඇති කොරියාව, චීනය, ජපානය, වියට්නාමය වැනි රටවල ද මෙම ග්‍රන්ථයන් ජනප්‍රිය වුවත් ඒ ඒ රටවලට ආවේනික වූ ධර්ම ග්‍රන්ථ වෙයි. නිදසුනක් ලෙස ජපන් මහායාන සම්ප්‍රදායේ ජනප්‍රිය ධර්ම ග්‍රන්ථ වන්නේ මකහරුමිකා හෙවත් මහාප්‍රඥාපාරමිතා සූත්‍රයයි. තව ද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ද එහි ජනප්‍රිය වූවකි. සෙසු ධර්ම ග්‍රන්ථ පිළිබඳ අවබෝධයක් ජපන් බෞද්ධයන් තුළ එතරම් නොමැත. සෙසු රටවලද ස්වභාවය එයයි.

නවධර්ම සාහිත්‍යය වෛපුල්‍ය යන නාමයෙන්ද හඳුන්වනු ලබයි. විපුල යන පදයෙන් සෑදෙන තද්ධිත පදයක් වන වෛපුල්‍ය යන්නෙහි අර්ථය වන්නේ සවිස්තරව සාකච්ඡාවන පුළුල් මාතෘකා යන්නයි.[4] ඇතැමෙක් මෙම සූත්‍රයන් හඳුන්වන්නේ මහා වෛපුල්‍ය යන නාමයෙනි. එහෙත් එයින් ගම්‍ය වන සුවිශේෂ අර්ථයක් නොමැත. මෙම සූත්‍ර සාහිත්‍යය හැඳින්වීමට වෛතුල්‍ය වෛදල්‍ය යන නාමයන්ද භාවිත කර ඇති බව කියවෙයි. මහායාන බුදුසමය දක්ෂිණ දිග ප්‍රදේශයේ පැතිර යන විට එම වදන් භාවිත වන්නට ඇතැයි සැලකෙයි.[5] ඇතැම් ආචාර්යවරයෙක් ප්‍රකාශ කරන්නේ වෙපුල්‍ය වෛදල්‍ය වෙවතුල්‍ය යන වදන් සමාන වන බවයි. ඒ බව "වෛපුල්‍යං කතමත් බෝධිසත්ව පිටක සම්ප්‍රයුක්තම්භ භාෂිතම් යද්‍ුච්‍යතේ උපමාන ධර්මානාම් තුලනාභාවත"[6] මෙහි වෛපුල්‍ය යනු බෝධිසත්ව පිටකය හා බැඳුණු දේශනයයි. එනම් සියලු සත්ත්වයින්ට හිත සුව පිණිස වූ දේශනාවයි. සත්ත්වයා සසර ගමන සිදු කිරීමට හේතුවන සියලු කෙලෙස් ප්‍රහාණය කරන හෙයින් මෙම ධර්මය වෛදල්‍ය නමින් ද හඳුන්වයි. එසේම මහායාන ධර්මය හා සමාන කළ හැකි අන්කිසි ධර්මයක් ලොව නොපවතිණ බැවින් වෛතුල්‍ය නම් වන බවද පැවසෙයි.

ථේරවාද බෞද්ධ සම්ප්‍රදායේ නවාංග ශාස්තෘ සාසනය බෙදා දක්වන අවස්ථාවේ දී චුල්ලවේදල්ල හා මහාවේදල්ල යනුවෙන් බෙදීමක් වෙයි. මෙම වේදල්ල යන පදය වෛදල්‍ය යන්නට සමාන වාචකයක් විය හැකි බව එඩ්වඩ් මුලර් මහතා ප්‍රකාශ කරයි.[7] එහෙත් මහායාන බුදුසමය තුළ ද නවාංග ශාස්තෘ සාසනය වෙනුවට ද්වාදසාංග සාසනය යනුවෙන් අංග දොළසකින් යුත් බෙදීමක් දක්නට ලැබෙයි. ථේරවාදි සම්ප්‍රදායේ නවාංගයට ම තවත් අංග තුනක් එක් කොට මෙම බෙදීම සිදුකර ඇත. අභිසමයාලංකාර ලෝකය නම් ග්‍රන්ථයේ මෙම විභජනය දක්වා ඇති බව මොරටුවේ සාසනරතන හිමියන් තම ලක්දිව මහායාන අදහස් නම් ග්‍රන්ථයේ දී සඳහන් කරයි.



සූත්‍රං ගේයං ව්‍යාකරණං ගාථෝදානාවදානකම්
ඉතිවෘත්තිකං නිදානං වෛපුල්‍යං ච ස ජාතකම්
උපදේශෝද්භූත ධර්මෝ ද්වාදශාංගම් ඉදංවචඃ[8]

සූත්‍ර, ගෙය්‍ය, ව්‍යාකරණ, ගාථා, උදාන, අවධාන, ඉතිවුත්තක, නිදාන, වෛපුල්‍ය, ජාතක, උපදේශ, අද්භූත යනු එම ද්වාදසාංග විභජනයයි.

දෙවන ධර්ම සංගායනාවෙන් අනතුරුව බිහි වූ දහඅට නිකායන් අතර වෛතුල්‍ය නමින් නිකායක් විය. නිකාය සංග්‍රහයේ දැක්වෙන ආකාරයට ථේරවාදී සම්ප්‍රදායට හාත්පසින්ම විරුද්ධ වූ සම්බුද්ධ දේශනාව ස්වකීය අභිමතය පරිදි අර්ථකථනය කළ අධර්මවාදී නිකායකින් ප්‍රභවය වූ නිකායක් ලෙස වෛතුල්‍යවාදීන් හැඳින්විය හැකිය.[9]

### අන්තර්ගතය

වර්තමාන මහායාන බෞද්ධයන්ගේ සම්භාවනාවට පාත්‍ර වූ නව ධර්ම ග්‍රන්ථනාමාවලිය මෙසේය.

1. අෂ්ටසාහශ්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍රය
2. සද්ධම්ම පුණ්ඩරීක සූත්‍රය
3. ලලිත විස්තරය
4. ලංකාවතාර සූත්‍රය
5. සුවර්ණ ප්‍රභාෂ සූත්‍රය
6. ගණ්ඩව්‍යුහ සූත්‍රය
7. තථාගත ගුහ්‍යක සූත්‍රය
8. සමාධිරාජ සූත්‍රය
9. දශභූමිස්වර සූත්‍රය

නවධර්ම නමින් සම්භාවිතව ඇති මහායානික සූත්‍රවලට අමතරව මහායාන දෘෂ්ටිවාදය අන්තරගත ග්‍රන්ථ බොහෝ ප්‍රමාණයක් දැකිය හැකිය. ඒවා අතර සුඛාවතී ව්‍යුහ සූත්‍රය,

කරණ්ඩ ව්‍යුහ සූත්‍රය, රාෂ්ට්‍රපාල සූත්‍රය, කරුණා පුණ්ඩරීක සූත්‍රය, ආර්ය ශාලිස්තම්බ සූත්‍රය, මඤ්ජු ශ්‍රී මූල කල්පය අමිතායුර්ධ්‍යාන සූත්‍රය, සන්ධි නිර්මෝචන සූත්‍රය මහා පරිනිර්වාණ සූත්‍රය ආදිය ඉන් සමහරකි. මෙම සූත්‍ර අතරින් ඇතැම් සූත්‍ර වෛපුල්‍ය නමින් හඳුන්වා ඇත. ඇතැම් සූත්‍ර හඳුන්වන්නේ අවතංසක යන නාමයෙනි. නව ධර්ම ග්‍රන්ථ අතරින් ද සමාධිරාජ සූත්‍රය අවතංසක ගණයට අයත්වෙයි. සෙසු ග්‍රන්ථ අට හඳුන්වනු ලබන්නේ වෛතුල්‍ය යන නාමයෙනි. මෙම වර්ගීකරණයෙන්ද පැහැදිලි වන්නේ ථේරවාදී සම්ප්‍රදායේ මෙන් ත්‍රිපිටකයක් මහායාන සම්ප්‍රදායේ නොපැවති බවයි.

ථේරවාද බෞද්ධ සම්ප්‍රදායෙන් බිඳීගිය ආගමික සම්ප්‍රදායන් රාශියක් තිබුණ ද මහායාන සම්ප්‍රදායෙන් බිඳීගිය නිකාය සංඛ්‍යාව දෙකකි. එනම් විඥානවාදී යෝගාචාර සම්ප්‍රදාය හා ශූන්‍යතාවාදී මාධ්‍යමක සම්ප්‍රදායයි. යෝගාචාරයන් මෙන්ම මාධ්‍යමකයන් ද ස්ව මත තහවුරු කිරීම සඳහා තර්කානුකූලව ඉදිරිපත් කරන ලද ග්‍රන්ථ සමූහයක් වෙයි. යෝගාචාරීන් විසින් යෝගාචාර භූමි ශාස්ත්‍ර, අභිසමයාලංකාරය, බෝධි චර්යාවතාරය, ශික්ෂා සමුච්ඡය, මහායාන ශ්‍රද්ධෝත්පාද වජ්‍රශූචිය වැනි ග්‍රන්ථ ද මාධ්‍යමක සම්ප්‍රදායේ පුරෝගාමීන් විසින් මූල මාධ්‍යමක කාරිකාව විග්‍රහ ව්‍යවර්තනිය වැනි ග්‍රන්ථයන්ද වෙයි.

මහායාන සම්ප්‍රදායේ එන සියලුම ධර්ම ග්‍රන්ථයන්හි අරමුණ වන්නේ එකකි. එනම් බෝධිසත්ත්ව චර්යාව සම්පූර්ණ කිරිමයි. ඒවා සූත්‍ර වශයෙන් හෝ ශාස්ත්‍ර වශයෙන් වර්ගීකරණය කර තිබුණ ද ඉහත අරමුණින් බැහැර වූ බවක් ඒවායෙහි දැකිය නොහැකිය. බෝධිසත්ත්ව චර්යාව සම්පූර්ණ කොට බුදු කෙනෙකු වශයෙන් නිර්වාණයට පත්වීම එකී අරමුණයි. ඒ සඳහා උගන්වා ඇත්තේ එකම මාර්ගයක් පමණි. එනම් මහායානයයි. බුද්ධයානය යන අපර නාමය ද මෙයට භාවිත කරයි.

මහායාන සම්ප්‍රදායට අයත් නවධර්ම අතුරින් වඩාත් වැදගත් වූත්, අතිශය ජනප්‍රියත්වයට පත් වූත් ග්‍රන්ථය වන්නේ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය යි. ''කළලින් උපන් සද්ධර්මය නැමැති සුදු



නෙළුම'' යන වචනාර්ථය දෙන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය එනමින් හැඳින්වීමේ පදනම ග්‍රන්ථයේ සඳහන් වන්නේ කළලින් උපන් පුණ්ඩරීකය එහි නොගැටී පවත්නා සේ මේ සත්ත්ව ලෝකයෙහි උපන් බුදුහු ක්ලේෂයන්හි නොගැටී සිටින හෙයින් සද්ධර්ම පුණ්ඩරීකයක් වන බවයි.

දේවාතිදේව, බ්‍රහ්මාතිබ්‍රහ්ම නමින් හැඳින්වෙන බුදුරදුන්ගේ රූපශ්‍රීය මෙන්ම පරමෝත්කෘෂ්ටභාවය අති උත්කර්ෂයෙන් සහ මායාන්විත ස්වරූපයකින් වර්ණනාවට ලක් කිරීම සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය රචනා කිරීමේ අරමුණ වූ බැව් පෙනේ. මෙය රචනා කිරීමේ පරමාර්ථය ග්‍රන්ථාරම්භයෙහි සඳහන් වන්නේ මෙසේ ය. ''සත්ත්වයන්ගේ පරමාර්ථප්‍රාප්තිය සඳහා උතුම් වූ උපාය හෙළි කරන්නා ව ශ්‍රේෂ්ඨ මාර්ගය වන්නා වූ සද්ධර්ම පුණ්ඩරීක පියුම නමැති වෛපුල්‍ය සූත්‍ර රාජයා දේශනා කරන්නෙමි.'' යනුවෙනි.

''වෛපුල්‍ය සූත්‍ර රාජං පරමාර්ථනයාවතාර නිර්දේශම්
සද්ධර්ම පුණ්ඩරීකං සත්වාය මහාපථං වක්‍ෂ්‍ය''[10]

අනෙකුත් මහායාන ග්‍රන්ථයන්හි පිළිගත් දෘෂ්ටිවාදය සද්ධර්ම පුණ්ඩරීකයේ ද දක්නට ලැබෙන නමුදු දාර්ශනික අංශය පිළිබඳ එතරම් සැලකිල්ලක් නොදක්වා ඇති බවත් ආගමික ලැදියාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බවත් ග්‍රන්ථ පරිශීලනයෙන් පැහැදිලි වේ. එම නිසා මෙය වෛපුල්‍ය සූත්‍ර අතර විනය ග්‍රන්ථයක් ලෙස හැඳින්විය හැකිය. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මහායාන ධර්මයේ එක්තරා භූමිකාවක් පමණක් වන බව විද්වතුන්ගේ පිළිගැනීම වෙයි.[11]

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ දක්නට ලැබෙන භාෂා ශෛලිය අනුව එනම් මිශ්‍ර සංස්කෘත භාෂාව සැලකිල්ලට ගැනීමේ දී මෙය රචනා වූ කාලය ක්‍රි.ව. 1 වන සියවසට අයත් වන බව විද්වතුන්ගේ පිළිගැනීමයි.[12] ක්‍රි.ව. 1 දී පමණ රචනා වන්නට ඇතැයි කල්පනා කළ හැකි වන්නේ ක්‍රිස්තු පූර්ව සියවස්වල සිටම සර්වාස්තිවාදී බෞද්ධයන් විසින් පාලි පිටක ග්‍රන්ථ සංස්කෘත කරණයට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් සේ ගිණිය

හැකි නිසාවෙනි. ඔවුහු පාලි හා සංස්කෘත යන භාෂා දෙකම දැන සිටියහ.

වින්ටර්නීට්ස්ට අනුව මෙහි නිශ්චිත කාලවකවානුවක් පිළිබඳ සඳහන් කළ නොහැකි ය.[13] ඊට හේතු ලෙස මෙහි දක්නට ලැබෙන ගද්‍ය කොටස් බෞද්ධ සංස්කෘතයෙනුත් පද්‍ය කොටස් මිශ්‍ර සංස්කෘතයෙනුත් යුක්ත වීම නිසා එකවර සංග්‍රහවූවක් සේ ගිණිය නොහැකි නිසාවෙනි. ඇතැම් විට මෙය මුලින් කාව්‍ය සංග්‍රහයක් වී පසුව වර්තමානයේ දක්නට ලැබෙන අයුරින් සකස් වන්නට ඇත. ගාථා අඩංගු නොවන පරිච්ඡේද වෙනත් කරුණු අනුව පශ්චාත් කාලීන එකතු කිරීම් බව පිළිගත හැකි ය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ මූලික ග්‍රන්ථය ක්‍රි.ව. 200 ට පමණ අයත් වෙතැයි ද ඇතැම් විද්වත්හු නිගමනය කරති. එහෙත් ක්‍රි.ව. 286 දී ධර්මරක්ෂ නම් භික්ෂුව විසින් මුල් පිටපත ක්‍රි.ව. 3 වන සියවසට පූර්ව යුගයේ සකස් නොවන්නට ඇතැයි නලිනාක්ෂදත්ත විශ්වාස කරයි. මෙය තවදුරටත් පැහැදිලි කරමින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ භාෂා ලක්ෂණ හා බුද්ධ චරිතය පිළිබඳ විස්තරය අනුව මහාවස්තුව හා ලලිත විස්තරය රචනා වීමෙන් මඳ කලකට පසුව මෙය රචනා වන්නට ඇති බවත් එහි කාලනිර්ණය ක්‍රි.ව. 2 හෝ 1 වැනි සියවස විය හැකි බවත් නිගමනය කර තිබේ.[14]

පරිවර්ත හෙවත් පරිච්ඡේද 27 කින් සමන්විත සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය වෙනත් මහායාන සූත්‍ර මෙන්ම බුදුන් වහන්සේ ගිජුකුළු පව්වෙහි දී දේශනා කළ බව දැක්වේ. එම අවස්ථාවට එක්රැස් වූ අතිවිශාල ශ්‍රාවක පිරිසගේ නාම ලේඛණයක් පළමු පරිච්ඡේදයෙහි අන්තර්ගත වේ. හයදහසක් කිරි මවුවරුන් ප්‍රධාන බෝධිසත්ත්ව මාතාව ද යශෝදරාව ද අසූදහසක් බෝධිසත්ත්වවරුන් සමග මඤ්ජු ශ්‍රී අවලෝකිතේශ්වර ද එහි පැමිණි පිරිස අතර විය. මෙහිදී බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කරනු ලබන්නේ ශාරිපුත්‍රයන්ට ය. "භගවාන් ඒතද් අවෝචත් කදාචිත් කර්හිචිත් ශාරිපුත්‍ර තථාගතඃ ඒවරූපාං ධර්මදේශනාං කථයති.... දුර්බෝධ්‍යං ශාරිපුත්‍ර තථාගතස්‍ය සංඝාභාෂ්‍යං"[15]



මෙයින් ප්‍රකාශ වන්නේ බුදුරදුන් කිසියම් දිනෙක කිසියම් අවස්ථාවක දේශනා කළ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙන් ප්‍රකාශයට පත් වූ අර්ථයට සමාන වූ ධර්මයක් මෙහි දී දේශනා කරන ලද බවයි. උදුම්බර පුෂ්පයක් අසාමාන්‍ය ලෙසින් පිපෙන්නාක් මෙන් අසාමාන්‍ය වූ මෙබඳු ධර්මයක් බුදු කෙනෙකුන් දේශනා කරනුයේ ද බොහෝ කලාතුරකින් බවත් මෙයින් කියැවේ. වෙනත් තැනක දී විශාල පිරිසක් උදෙසා දේශනා කරන ධර්මය "සංඝාභාෂ්‍ය" නමින් හැඳින්වේ. ඒ අනුව මෙම සූත්‍ර ධර්මය ද සංඝාභාෂ්‍යයක් වන හෙයින් දුරවබෝධ වන බව ද මෙහි දී අවධාරණය කර තිබේ.

බුදු කෙනෙකුන් ලෝකයේ ප්‍රාදුර්භූත වීමේ එකම හේතුව නිමිත්ත සහ උන්වහන්සේගේ එකම කාර්යභාර්ය වන්නේ තථාගත ඥාන දර්ශනයට සියලු සත්ත්වයින් පත් කරවීමයි. මෙයින් ගම්‍ය වන්නේ අනෙකුත් ඥාන දර්ශනයන් වන පසේ බුදු මහරහත් යන ඥාන දර්ශනයන්ට යොමු නොවී තථාගත ඥාන දර්ශනය සඳහා ම නොඑසේ නම් බුද්ධත්වයට පත් වීම එකම අරමුණ විය යුතු බවයි. නිර්වාණය සඳහා පවත්නා එකම යානය බුද්ධයානය හෙවත් මහායානය පමණක් වන බව මෙහි දී අවධාරණය කොට ඇත.

> "ඒකං හි එව අහං ශාරිපුත්‍ර යානං ආරභ්‍ය සත්වානං ධර්මං දේශයාමි.
> යදිදං බුද්ධයානං න කිඤ්චිත් ශාරිපුත්‍ර ද්වීතියං වා තෘතීයං වා යානං සංවිද්‍යතෙ.
> සර්වත්‍ර ඒෂා ශාරිපුත්‍ර ධර්මතා දශදිග් ලෝකේ"[16]

මෙහි දෙවන පරිච්ඡේදය සද්ධර්ම පුණ්ඩරීක දේශනාවෙහි වටිනාකම විස්තර කෙරෙන අතර තෙවැන්නේහි දී ශාරිපුත්‍ර හිමියන්ගේ ප්‍රහර්ෂාත්මක ප්‍රකාශය සඳහන් වෙයි. ශාරිපුත්‍ර හිමි පෙර නොඇසූ ධර්මයක් ඇසූ බවත් ඊට පූර්වයෙන් අවබෝධ කර ගැනීමට නොහැකි වූ යථාර්ථය මෙහිදී අවබෝධ කරගත් බවත් මෙම ප්‍රහර්ෂාත්මක ප්‍රකාශයේ අන්තර්ගත වෙයි. අනතුරුව දැක්වෙන පරිච්ඡේද කිහිපය අතුරින් බුදුන් වහන්සේගේ උපාය

කෞශල්‍යය හෙළි කරමින් ලෝක සත්වයාට පිහිට වන ආකාරය දෘෂ්ටාන්ත ඇසුරින් ඉදිරිපත් කර තිබීම සිත් ගන්නා සුලු වෙයි.

සිවුවැනි අධිමුක්ති පරිවර්තනයේදී නාස්තිකාර පුත්‍රයා පිළිබඳ දෘෂ්ටාන්තයේ දී බුදුන් වහන්සේ නිරූපණය වන්නේ ස්වකීය දරුවන්ගේ දියුණුව පතන යහපත් පියෙකු ලෙසිනි. මෙහි දැක්වෙන ''අධිමුක්ති'' යන වචනයෙහි අර්ථය වන්නේ ''ඇලීම'' යන්න යි. ඒ අනුව පුද්ගලයින්ගේ චෛතසික ක්‍රියාකාරීත්වයේ ඇති අඩුලුහුඬුතා හඳුනාගනිමින් ක්‍රමානුකූලව උසස් තත්ත්වය කරා ගෙන යන ආකාරය දක්නට ලැබේ.

මෙහි දැක්වෙන උපමා කතාව අනුව එක්තරා පුත්‍රයෙක් සිය පියාගෙන් ඈත්ව වසර ගණනාවක් විසීමෙන් පසු දිළිඳු භාවයට පත් වෙයි. මේ අතර ඔහුගේ පියා ධනවතෙකු වී වෙනම ප්‍රදේශයක වාසය කරයි. දිළිඳු පුත්‍රයා ආහාර හා වස්ත්‍ර සොයමින් ඇවිදින අතර සිය පියාගේ නිවස අසලින් ද ගමන් කරයි. තම දරුවා ගැන සිතමින් පසු වූ මහලු පියා ඔහු හඳුනා ගැනීමෙන් පසු සේවකයින් යවා ඔහු ගෙන්වා ගැනීමට යත්න දරයි. එහෙත් ඉන් බියපත් වන දිළිඳු පුත්‍රයා තමන් රාජ අණසකට පත් වූයේ දැයි බියපත්ව දිව යයි. කෙසේ හෝ ඔහු අල්වාගෙන පියා හමුවට ගෙන ආ පසු සිහිසුන්ව ඇද වැටෙන නිසා ඔහුගේ මනසේ හීනභාවය නොඑසේනම් හිනාධිමුක්තික බව තේරුම් ගත් පියා ඒ බවක් තම පුතුට නොකියයි. සේවකයින්ගේ මාර්ගයෙන් ඔහුට මාළිගයේ කසල ශෝධක තනතුර දී පියා ප්‍රධාන වැඩකරුවෙකු ලෙස පෙනී සිටිමින් ඔහු සමඟ මිත්‍ර වී පෞද්ගලික ලේකම් තනතුරට පත් කරයි. එතෙකුදු වුවත් ඔහුගේ මානසික වර්ධනයක් නොවූයෙන් කිසිවක් නොපවසා සිටියි. පසුව මරණාසන්න වූ පියා ඥාතිවරුන් කැඳවා මොහු සිය පුතා බව දන්වා සියලු වස්තුව පවරා දීමෙන් කතාව නිම වෙයි.

මෙහි මහලු පියා ලෙස පෙනී සිටි බුදුන් වහන්සේ ද ඉහත ආකාරයෙන් ලෝක සත්ත්වයාගේ මානසික මට්ටම අනුව ඔවුන් ක්‍රමයෙන් උසස් බවට පමුණුවමින් විශේෂයෙන් අර්හත්වය සහ පසේබුදු බව පෙන්වා දී ඒවායේ අපරිපූර්ණ බව පෙන්වා



නිර්වාණය සඳහා වන එකම යානය වන බුද්ධයානය උසස් වන ආකාරය පෙන්වා ඒ මගින් මහායානයට ඇති ලැදියාව ගම්‍යකර තිබේ.

විචිත්‍ර වූ උපමා කතා මගින් බුදුරදුන්ගේ උපාය කෞශල්‍යඥානය ප්‍රකට කරන්නා වූ මෙම ග්‍රන්ථයෙහි දැක්වෙන තවත් දෘෂ්ටාන්තයක් මෙසේය. දරුවන් සමග පියෙකු ජීවත් වූ දිරාපත් නිවස හදිසියේ ගිනිගත් අවස්ථාවේ නිවස තුළ සෙල්ලම් කරමින් සිටි දරුවන් බේරා ගැනීම සඳහා යෙදූ උපාය සිත් ගන්නා සුලු වෙයි. ක්‍රීඩා භාණ්ඩ නොමැති ඒ ළමුන්ට එළිමහනේ ගව කරත්ත එළු කරත්ත, මුව කරත්ත ඇති බව ප්‍රකාශ කිරීමෙන් පසු ඔවුහු එළියට දිවවිත් ගින්නෙන් බේරෙති. මෙම කරත්ත තුනෙන් ඉතා අලංකාර සහ වටිනා රථය ලෙස ගවකරත්තය දැක්වීමෙන් ත්‍රිවිධ යාන අතර බුද්ධයානය උසස් වන බව ධ්වනිත කර තිබේ.

තවත් දෘෂ්ටාන්තයක රෝගී වූ දරුවන්ට ප්‍රතිකාර කරන කරුණාවන්ත වෛද්‍ය පියෙකු ලෙසින් බුදුන් වහන්සේ නිරූපණය කර ඇති අතර එමගින් බුදුරදුන් ලෝක සත්ත්වයාගේ මානසික සුවය සඳහා මාර්ගය පෙන්වා දෙන බව ප්‍රකට කර තිබේ. 15 වන පරිවර්තයේ 21 වන ගාථාවට අනුව බුදුන් ලෝක සත්ත්වයාට පියෙකු මෙන්ම වෛද්‍යවරයෙකු හෝ ආරක්ෂකයෙකු වන බවත් සදාකාලිකව ජීවත් වන උන්වහන්සේ පිරිනිවන් පෑ බව හඟවන බවත් පැවසේ. ඒ අනුව උන්වහන්සේ පිරිනිවන් පෑ බව හඟවනුයේ ද ලෝක සත්ත්වයා කෙරෙහි ඇති අනුකම්පාව මෙන්ම ඔවුන්ගේ අවබෝධතා ඥානයේ අඩුලුහුඬුකම් සැලකිල්ලට ගැනීම නිසා බව පැහැදිලි වෙයි. 5 වන ඕෂධී පරිවර්තයේ දී බුදුන් කාරුණික පියෙකු සේම වෛද්‍යවරයෙකුට ද උපමා කර තිබේ. දීර්ඝ දෘෂ්ටාන්තයක් සේ ඉදිරිපත් කෙරෙන මෙහි දී ලෝක සත්ත්වයා ජාත්‍යන්ධයන් මෙන් ද ඔවුන් සුවපත් වන්නේ භෛෂජ්‍යරාජයන්ගේ උපකාරයෙන් බව ද විස්තර කෙරේ. බුදුන් වහන්සේගේ මෙම කරුණාන්විත පරාර්ථචර්යාව මෙහි දි වර්ෂාවට සහ ආලෝකයට උපමා කර ඇති අයුරු දකිය හැකිය.

මෙහි නවවැනි පරිවර්තයේ ආනන්ද රාහුල දෙනමගේ අනාගත ජීවිතය ගැන සඳහන් වේ. එකොළොස්වන පරිවර්තය ප්‍රභතරතන නම් බුදුවරයෙකු ගැන සඳහන් වන අතර දෙව්දත් නොමැතිනම් තමාට බුදුවිය නොහැකි බව ද ප්‍රකාශව තිබේ. විසිඑක් වැනි පරිවර්තය සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය හදාරණ සහ අනුගමනය කරන බෝධිසත්ත්වවරුන්ට අමනුෂ්‍ය උපද්‍රවවලින් වැළකීමට ''ජුවෙල් මහා ජුවෙල්...'' යනාදී මන්ත්‍ර කිහිපයක් උගන්වා තිබේ. විසිහතරවැනි පරිවර්තය අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් ගැන වර්ණනාවකින් සමන්විත වේ. විසිහය වැන්න බුදුරදුන්ගේ පිරිනිවීමෙන් පසු ධර්මය සහ ධර්ම දේශකයන් ආරක්ෂා කිරීමට සමන්තභද්‍ර බෝධිසත්ත්වයන්ට පවරා තිබේ.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ හමුවන විශේෂ ලක්ෂණ අතර වාග්බාහුල්‍යය උපමාකතාවල ප්‍රමාණික්‍රාන්ත බව ග්‍රන්ථය පුරාවටම දැකිය හැකි වෙයි. බුදුවරුන් බෝසත්වරුන් මෙන්ම කාලය පිළිබඳ දැක්වීමේ දී අතිශෝක්තියට දැක් වූ උනන්දුව පිළිබඳ වටහා ගත හැකි ය. බුදුවරයෙකුගේ කාලය දැක්වීමේ දී සියදහස් කෝටි අසංඛ්‍ය කල්පයක් ලෙස ද භාරතයේ ම ඇති දූවිලි අංශු ප්‍රමාණය හා සමාන කාලයක් වශයෙන් ද පැවසීම මීට නිදසුන් වෙයි. මෙබඳු අතිශෝක්ති වර්ණනා තුළින් පාඨකයා මවිතයට පත් වෙයි. 14 වන පෘථිවි විවර සමුද්ගම පරිවර්තයේ මෙම ලක්ෂණ බෙහෙවින් දැකිය හැකිය.

මහායානයේ ජනප්‍රිය ආගමික සංකල්ප අතර මූර්ති පූජා ස්තූප පූජා, බුද්ධ පූජා ආදියෙන් මහත් කුසලයක් අත්වන බව ද සඳහන් වේ. එපමණකුදු නොව මෝඩයෙකු වුව ද බුදුරුව සිත්තම් කර එක මලක් හෝ පූජා කරන්නේ නම් හෙතෙම ඒ කුසලයෙන් ලක්ෂ සංඛ්‍යාත බුදුවරුන් දකින බවත් ''නමෝස්තු බුද්ධාය'' යන මන්ත්‍රය කීමෙන් පවා අග්‍රබෝධි ඥානය ලබන බවත් සඳහන් වේ.

සද්ධර්මපුණ්ඩරික සූත්‍රය කෙතරම් ජනප්‍රිය වී ද යත මෙහි අත්පිටපත් බොහෝමයක් නේපාලය හා මධ්‍ය ආසියාතික රටවල



දක්නට ලැබීමෙන් පැහැදිලි වෙයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ද ඇතැම් බෞද්ධයන් අතර සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය ප්‍රචලිත වීමේ ප්‍රවණතාවන් දක්නට ලැබීම එහි පශ්චාත් කාලීන ජනප්‍රියත්වයට නිදසුනක් වෙයි.

## ආන්තික සටහන්


1 winternitz, M. A History of Indian Literature, Vol, II, 124p.

2 ගල්මංගොඩ, සුමනපාල. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, ප්‍රස්තාවනාව, පි. 4

3 winternitz, M. A History of Indian Literature, Vol, II, 295p.

4 මාරසිංහ, වෝල්ටර්, ලලිත විස්තරය, ඥාණාංජලී, සංස් ඥාණවීර හිමි, රණස්ගල්ලේ ආදි අය, පි. 468

5 සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මාහායාන අදහස්, පි. 68

6 Pralhad Pradhan, Abhidharmasamuccaya of Asanga, 79p.

7 Muller Edward, Attasalini, 26p

8 සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්, පි. 68

9 කුමාරතුංග, මුනිදාස. නිකාය සංග්‍රහ විවරණය, පි. 6

10 සේනානායක, ජී.එස්.බී. සංස්කෘත සාහිත්‍යය, පි. 229-231

11 Sthavira Sangharaksitas, Survey of Buddhism, 6 p.

12 නරේන්ද්‍රදේව, බෞද්ධ ධර්ම දර්ශන, පි. 142

13 Winternitz, M. History of Indian Literature, Vol. II, 392 p

14 Dutt. N. Saddharma Pundarika Sutram, XVI, XVI. pp.

15 ගල්මංගොඩ, සුමනපාල. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, පි. 22

16 ගල්මංගොඩ, සුමනපාල. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය, පි. 4


25 MAY 2022
පුස්තකාලය